# බළන්ගොඩ නගර සභා විශේෂ රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| **ස්ථානය** | : | **බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව** |
| **දිනය** | : | **2015-02-16** |
| **වේලාව** | : | **පෙ.ව. 10.00** |

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වයඃ**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | නගර සභා ගරු මන්ත්‍රී | එම්.ටී.එම්.රූම් මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | ඒ.අසංක විජය නිල්මිණි මැතිතුමා |
| 8. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 9. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීමඃ

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

විශේෂ සභාවක් හෙයින් පසුගිය වාර්තා ඉදිරිපත් නොකෙරුණි.

## 03. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

මෙදින සභාවේදි සමාලෝචන ඉදිරිපත් නොවිනි.

## 04. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින විශේෂ සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

කාර්මික නිලධාරී මහතාගේ දියණියගේ වියෝවය පිළිබඳ සභාවේ ශෝකය පළ කරන බවද සඳහන් කළ ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීවරුන්ගේ විශේෂ ඉල්ලීම මත මෙම සභාවාරය පවත්වන බවද, තානායමේ වත්මන් තත්ත්වය සාකච්ඡා කිරීම ප්‍රධාන අරමුණ බවද ප්‍රකාශ කරන ලදි.

## 05. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 05:01 තානායමේ වත්මන් තත්තවය පැහැදිලි කර ගැනීම

**ගරු සභාපතිතුමා**

තානායම පිළිබඳව පළාත් පාලන කොමසාරිස්තුමිය හා ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා අතර සිදුවූ සාකච්ඡාවකින් පසු කරුණු ඉදිරිපත් කරන ලෙස ඉල්ලීමක් කර තිබූ බවද, එසේම අභියාචනයක් ඉදිරිපත් කර තිබූ බවද පෙබරවාරි 13 වන දින කොමසාරිස්වරියගේ අත්සනින් ලිපියක් ලැබීඇති බවද එයට අනුව බළන්ගොඩ තානායම පොදුවේ ලාභ ලබා ඇති අතර නගර සභාව විසින් පවරාගෙන පවත්වාගෙන යන ව්‍යාපාරයක් හෙයින් ඉදිරියටද සභාවෙන් පවත්වාගෙන යාමට උපදෙස් ලබාදෙන බව ද එයින් දන්වා ඇති බව ප්‍රකාශ කරන ලදි. එහිදී දැනට අලාභයක් සිදුව ඇති දේ නිවැරදි කර අඩුපාඩු සකස්කර ඉදිරි මාස 03ක කාලයක් පවත්වාගෙන යන අතර ඒ පිළිබඳ තොරතුරු තමාට වාර්තා කරන ලෙස ද පළාත් පාලන කොමසාරිස් තුමිය දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදි. එසේම පෙර සභාවේ සාකච්ඡා කළ පරිදි නගර සභා කාර්ය මණ්ඩලය යොදවා හෝ තානායම පවත්වාගෙන යාම සුදුසු බව ද යම් යම් අවස්ථාවල ලාභ ලබන බවද එසේම පාඩු සිදුවිය හැකි බවද එතුමන් විසින් දන්වන ලදි.

තානායමේ විකුණුම් හා ලාභයන්ගේ ප්‍රතිශතයන් පිළිබඳ ගරු උපසභාපතිතුමා ගණකාධිකාරී මහතාගෙන් විමසන ලදි.

එම තොරතුරු ලබාගැනීම සඳහා ගරු සභාව කාරක සභා අවසථාවක් බවට ගරු සභාපතිතුමා පත් කරන ලදි.

මෙහිදී ගණකාධිකාරී මහතා විසින් පහත තොරතුරු සභාවට ඉදිරිපත් කරන ලදි.
ජනවාරි මස තානායමේ දළ ලාභය රු. 366516 ක් බවද ශුද්ධ ලාභය රු. 142000 ක් බවද විකුණුම් මිලෙන් 20% - 30% ක් අතර ලාභයක් පෙන්විය යුතු බවත් එසේම සාමාන්‍ය ලාභය 21% ක් වියයුතු නමුත් ශුද්ධ ලාභය මේවන විට 9.6% ක් පමණ වන බවත් දන්වා සිටින ලදි.

**ගරු උපසභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**
ශුද්ධ ලාභ ප්‍රතිශතය මෙලෙස අවම මට්ටමක තිබියදී පසුගිය සභාවාරයේ දී තීරණය කරගත් පරිදි තානායම ටෙන්ඩර් නොකර ඒ පිළිබඳ අධීක්ෂණයක් නොකර පළාත් පාලන කොමසාරිස්තුමිය මෙලෙස ලිපියක් එවීම සුදුසු නොවන බවද පවතින ගැටළු තත්ත්වය පිළිබඳ සොයා බැලීමට ඇය පැමිණිය යුතු බවද එසේම කොමසාරිස්තුමිය හමුවී එතුමිය ගත් මෙම ක්‍රියාමාර්ගය නිවැරදි නොවන ආකාරය පෙන්වා දෙන බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා**
තනායමේ සේවා ගිවිසුම මත බඳවා ගත් දෙදෙනෙක් ඉවත් කළ බවද, අවශ්‍ය වුවහොත් ඔවුන්ගේ සේවාව ලබාගන්නා බවද, දැනට සේවය කරන වේටර්වරුන් හා අරක්කැමියන්ගේ සේවය දින 20කට සීමා කරන බවත්, විවාහ උත්සවයක් පවතින්නේ නම් වේටර්වරු 3ක් සේවයේ යෙදී සිටිය යුතු බවද අනෙකුත් කටයුතු සඳහා සිටින කම්කරුවන් සඳහාද සේවා දින 20 ක් සඳහා සීමා පැනවූ බවද මේ නිසා වැටුප රු. 100000 -75000 ක් අතර ප්‍රමාණයක් අඩුකර ගත හැකි බවද ගරු සභාපතිතුමා විසින් පෙන්වා දෙන ලදි. එසේම ආහාරවල මිල වැඩි කිරීමට තානායම් කමිටුව සමග සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බවද, එසේම තානායමේ දැනට සේවය කරන කළමනාකාර මහතා සහ ගබඩාභාරකාර

මහතා විසින් තානායම මසකට රු. 100000 ක් ගෙවීමේ පදනම මත ලබාදෙන ලෙස අභියාචනයක් යොමු කර ඇති බවද දන්වා සිටින ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

සාකච්ඡාව දුරදිග ගෙන යාමේ තේරුමක් නොමැති අතර තානායමේ ලාභ නොමැති නම් එලෙස රු. 100000 ක් ගෙවන්නේ කෙසේදැයි විමසීමක් කරන ලදි.

**ගරු සභාපතිතුමා**

අභියාචනාකරුවන්ට ලබාදුනහොත් ඔවුන්ට වැට් අඩුවන බවද දැනට මසකට වැට් බදු රු. 150000 ක් ගෙවිය යුතු බවද, පුද්ගලික අංශයට ලබාදීමේදී වැට් බදු ගැටළු පැන නොනගින බවත්, වසරකට මිලිනය 120 ට වැඩි ආදායමක් ලබන්නේ නම් එම බදු ගෙවිය යුතු බවත් පෙන්වා දෙන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා**

සාර්ථක සභාවාරයක් බලාපොරොත්තු වුවද මෙය අසාර්ථක වූ බවද, නීතියෙන් පිට කරන කටයුතු සඳහා දැනුවත් වියයුතු බවත් ඒ සඳහා නියෝජිතයෙක් පළාත් සභාවෙන් බලපොරොත්තු වූ නමුත් එලෙස නිලධාරියෙක් සහභාගි වී නොමැති බවද, අද දින එම නියෝජිතයාට සහභාගි විය හැකි නොහැකි නම් ඔහුට හැකි දිනකට මෙම සභාව කල්දැමීම කළ යුතු බවත් මෙදින සභාව අතිශය අසාර්ථක බවද පවසන ලදි. කෙසේ ලාභ පෙන්නුවද තානායම ටෙන්ඩර් විය යුතුය යන මතයේ තමන් සිටින බවද ටෙන්ඩර් නොකර සිදු කරන කිසිදු ගෙවීමක් අනුමත නොකරන බවද ගරු මන්ත්‍රීතුමන් විසින් වැඩිදුරටත් පෙන්වා දෙන ලදි.

**ගරු සභාපතිතුමා**

විපක්ෂයට අවශ්‍ය ලෙස තානායම ටෙන්ඩර් නොකරන බවද, ඒ සඳහා සභාව බැඳී නොසිටින බවද, ඒ සඳහා පළාත් සභාවෙන් හා අවශ්‍ය අනෙකුත් ආයතන වලින් අනුමැතිය ලැබිය යුතු බවද, තානායමේ අතීතය පිළිබඳ හොඳින් දන්නා බවද, එය පවරා ගත්තේ නගර සභාවෙන් පවත්වාගෙන යාමේ පදනම මත බවද, මෙතෙක් කල් යම් යම් අවස්ථාවලදී හැර බොහෝ මාස වල ලාභ උපයා ඇති බවද, නගර සභාව පවරා ගන්නා කාලයේ රු. 3000 ක් වූ ආදායම 22000 දක්වා වැඩිකළ බවද පළාත් සභාවෙන් කෝටි ගණනක් ලබාගෙන එය සංවර්ධනය කර ඇති බවද, කිසිවෙකුටත් ප්‍රයෝජනයක් නොවූ තානායම අද නගර සභාව සතු දේපළක් බවට පරිවර්තනය කර ඇති බවද, එක් එක් පුද්ගලයන්ගේ දේශපාලන ප්‍රතිරූපය රැකගැනීම සඳහා තානායම ටෙන්ඩර් කිරීමට ක්‍රියානොකරන බව ද, නගර සභාවේ සහ රජයේ දේපළක් වූ ඩබල් කැබ් රථයට අලාභහානි කිරීම සම්බන්ධව කිසිවෙක් මේ වන තෙක් විමසීමක්වත් නොකළ බවද, තනතුරේ සිටින තෙක් මේ සියළු දේ රැකබලා ගැනීම වගකීම බවත්, බලය පවරා ඇත්තේ ඒ සඳහා බවත් ප්‍රකාශ කළ ගරු සභාපතිතුමා රු. 10000 ට වැඩි ගෙවීම් අනුමත නොකරන්නේ නම් එම රු. 10000 ට අඩුවෙන් බිල්පත් සකසා ගෙවීමට ඉදිරිපත් කරන බවද, ගෙවීම් අනුමත නොකරන්නේ නම් සභාව වසා දැමීමට සිදුවන බවද ගරු සභාපතිතුමන් විසින් පවසන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් විමසන ලද්දේ සභා දේපලක් පිළිබඳව බවත්, ජනතා නියෝජිතයෙක් ලෙස ජනතාව විසින් එතුමා මෙම ස්ථානයට පත්කර ඇති බවත්, එයට ඇහුම්කන් දී සාමාන්‍ය ලෙස පිළිතුරු සොයාගත යුතු විනා ශබ්ද නගා කථා කිරීමෙන් ගැටළු විසඳාගත නොහැකි බවද, යහපාලනය වෙනුවෙන් කටයුතු කරනු විනා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අත්හැර නොමැති බවත් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සමග කටයුතු කරන බවත්, ගරු සභාවේ දේපල වල ගැටළු මතු වන්නේ නම් ඒ පිළිබඳ ප්‍රශ්න කිරීම මහජන නියෝජිතයන් සතු අයිතියක් බවත් එම

අයිතිය සභාපතිතුමාට උදුරාගත නොහැකි බවත් විපක්ෂයේ වුවත් සහෝදර මන්ත්‍රීවරුන්ගේ හඬට කන්දිය යුතු බවත් මෙවැනි කාරණා නිසා නිලධරීන් අපහසුතාවයට පත්වන බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමන් ගැටළු සාකච්ඡා කර ගැනීමට විශේෂ සභාව කැඳවූ බවත්, තානායම පිළිබඳ ගරු සභාපතිතුමාගේ මතය නිවැරදිව පවසන ලෙසත්, මන්ත්‍රීවරු තමන්ගේ මතය ඉදිරිපත් කරන අතර සාධාරණ ක්‍රමයකට තීරණ ගතයුතු බව ද ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා**

තානායම වාර්ෂික වශයෙන් ගත් කළ පාඩු සිදු නොවන බවද, නමුත් මාසිකව බැලීමේදී යම් මාසවල පාඩු සිදුවිය හැකි බවද, එම පාඩු මගහැරගෙන ක්‍රියාකරන බවත්, තානායම නගර සභාවෙන් පවත්වාගෙන යායුතු බවත්, නගර සභාවේ නිලධාරීන් යොදා එය පවත්වාගෙන යාමට කැමති වූ නමුත් නිලධාරීන් ඒ සඳහා අකැමැති වූ බවත්, ජනවාරි මාසයේ දී යම් යම් ක්‍රියාමාර්ග ගැනීම තුළින් ලාභ වැඩි කර ගැනීමට ක්‍රියාකරන බවත්, රු. 10000 ට වැඩි ගෙවීම් අනුමත කරගෙන ඉදිරියට යායුතු බවත්, අනවශ්‍ය ලෙස කතා නොකරන බවත්, දේශපාලන වාසි ගැනීමට සඳහා කටයුතු නොකල යුතු බවත්, අනවශ්‍ය ගැටළු ඇතිකර නොගත යුතු බවත් ප්‍රකාශ කරන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී  චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා**

නගර සභා දේපළ විනාශ කිරීම පිළිබඳ කතා නොකල බවට චෝදනා මතු ඇති නමුත් ගරු සභාපතිතුමා තානායමේ ආරක්ෂිත වැට එක් ස්ථානයකින් ඉවත් කර ඇති බවත්, එයත් රාජ්‍ය දේපළ විනාශ කිරීමක් බවත්, ගරු සභාපතිතුමා සමග සුහදව කටයුතු කරන බැවින් ඒ පිළිබඳ ගැටළුවක් කර නොගන්නා බවත්, එසේම මහජනතාවට වගකීමට හා නීතිරීති වලට ගරු කිරීමට බැඳී සිටියත් පළාත් පාලන අමාත්‍යාංශයට හෝ ගරු සභාපතිතුමාට වගකීමට බැඳී නොසිටින බවත්,  විනිවිදභාවයකින් කටයුතු කළ යුතු බව තම අදහස බැව් ප්‍රකාශ කරන ලදි. ජනතාවට සේවය කිරීම සඳහා ඔවුන්ගේ නියෝජිතයෙක් ලෙස මෙම ස්ථානයට පැමිණි බවත් ඔවුන්ගේ දෝෂාරෝපණය තානායමට එල්ලවන බවත්, පසුගිය වාර්තා නිරීක්ෂණය කරන්නේ නම් නව ජනපති පත්වීමට පෙර සිටම 2011-04-01 පැවති සභාවේදීද මෙම ගැටළුව පිළිබඳ කතාකරන බවත් තානායම ටෙන්ඩර් විය යුතු බවත්, ව්‍යාජ මත ඇති නොකරන ලෙසද, මන්ත්‍රීවරුන් එක්වී ගරු සභාවේදී ගත් තීරණවලට අනුකූලව කටයුතු කළ යුතු බවත් ප්‍රකාශ කළ ගරු නාගරික මන්ත්‍රීතුමන් විසින් තානායම සඳහා නගර සභා නිලධාරීන් යාමට අකමැති හේතුව සොයා බැලිය යුතු අතර ඔවුන් අකමැතිනම් ඒ සඳහා හේතු සොයා විකල්ප ක්‍රියාමාර්ගයක් සොයාගත යුතු බවත් සුහදව කටයුතු කළ යුතු අතර එලෙස කටයුතු කරන්නේ නම් රු. 10000 ට වැඩි ගෙවීම් අනුමත කිරීමට නොපැකිළෙන බවත්, තානායමේ පැටලිලි සහගත තත්ත්වයක් ඇතිකර නිලධාරීන්ට තම රාජකාරිය නිසිලෙස කරගෙන යාමට නොහැකි තත්ත්වයක් මතු කර ඇති බවත්, එම තත්ත්වය වෙනස් කරන්නේ නම් නිලධාරීන් මෙම ස්ථානයට පැමිණ තානායමේ සේවයට කැමත්ත ප්‍රකාශ කරන බවත් දන්වන ලදි.

**ගරු සභාපතිතුමා**

පුද්ගලික දේවල් මෙම සභාවේ සාකච්ඡා නොකරන ලෙස ද, තානායමට යාමට ඇති පොදු මාර්ගය භාවිතා කිරීමට ආරක්ෂිත වැට ඉවත් කළ බවත්, නිලධාරීන් අනවශ්‍ය බැඳීමක් බැවින් තානායම් රාජකාරිය සඳහා අකමැති බවද පෙන්වා දෙන ලදි.

**ගරු උපසභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

විවිධ පිරිස් නොයෙක් ආකාරයේ කරුණු ඉදිරිපත් කළද ගැටළුවක් නොවන බවද තානායම් ගිණුමේ අවු. 03 කට රු. ලක්ෂ 36 ක් පැවති බවක් සඳහන් වූ අතර එය නොපිළිගන්නා බවත් තානායම සඳහා මිලදී ගන්නා භාණ්ඩ වෙනුවෙන් ගෙවීම් සිදුකළ යුත්තේ තානායම් ගිණුමෙන් බවත් එය එසේ සිදුවනවා දැයි ප්‍රශ්න කර සිටින ලදි.

එසේම පළාත් පාලන කොමසාරිස්තුමිය හෝ මහඇමතිතුමා සම්බන්ධ වී තානායම පිළිබඳ ගරු මන්ත්‍රීවරුන් සමග සාකච්ඡා කළ යුතු බවත් විනිවිද භාවයකින් කතාකර මෙම ගැටළුව පිළිබඳ සාක්ෂි සාධක ඇතිව සාකච්ඡා කළ හැකි බවත් ඒ සඳහා දිනයක් ලබාදෙන ලෙස ද ඉල්ලා සිටින ලදි. එසේම බළන්ගොඩ තානායමෙන් සේවා ලබාගත් මාතලේ මහ නගර සභාවේ බිල්පතවල සේවා ගාස්තුව 60000 ක් ලෙස සඳහන් වී ඇති නමුත් තානායම් බිල්පත් වල එය රු. 6000 ලෙස සඳහන්ව ඇති බවත් මෙවැනි කරුණු රාශියක් පිළිබඳ සාකච්ඡාකළ යුතු බවත් ගරු උප සභාපතිතුමා විසින් පෙන්වා දෙනලදි. එසේම ගරු සභාවේ සහ මන්ත්‍රීවරුන්ගේ ගෞරවය උදෙසා පළාත් පාලන කොමසාරිස් හෝ මහඇමතිතුමා හමුවී කරුණු පැහැදිලි කරන තෙක් තානායම ටෙන්ඩර් කළයුතුය යන ස්ථාවරයේ සිටින බවත්, පහත කරුනු පැහැදිලි කරන ලෙෂත් ඉල්ලා සිටින ලදි.

1. 2014-10-28 පැවති තානායම් කමිටුවේදී මාසික ආදායම 150000 ක් බලාපොරොත්තු වන බවත් එම ලාභය ලබාගැනීමට අසමත් වන්නේ නම් තානායම ලබන වසරේ සිට ටෙන්ඩර් කිරීමට නිර්දේශ කරන බවත් ගරු සභාපතිතුමන් විසින් පෙන්වා දෙන ලදි.
2. 2014-10-30 වන දින පැවති මහා සභාවේදී ගරු සභාපතිතුමා ඉදිරිපත් කල තානායම් කමිටු වාර්තාව ගරු රූමි මැතිතුමා ස්ථිර කළ අතර තානායමේ පාඩු සහගත තත්ත්වයන් නිසා ටෙන්ඩර් කිරීමට සුදුසු බව ගරු සභාපතිතුමා විසින් දන්වන ලදි. ඉදිරියේ තානායම ටෙන්ඩර් කිරීම බහුතරය මතය විය.

ඉහත කරුණු අනුව ගරු සභාපතිතුමා විසින් තානායම ටෙන්ඩර් කරන යෝජනාව ගෙන බවත් මේ වන විට අනෙකුත් පාර්ශවයන් සම්බන්ධ කරගෙන තානායම ටෙන්ඩර් කිරීම වැලැක්වීමට ගරු සභාපතිතුමා ක්‍රියාකරන බව පෙන්වා දෙන ලදි. එසේම ඉහත 02 කරුණෙහි සඳහන් බහුතර මතයට විරුද්ධ වූයේ ගරු නාගරික මන්ත්‍රී රූමි මැතිතුමා පමණක් බවද බහුතරය යනු කවුරුන්දැයි වාර්තාවට ඇතුළත් විය යුතු බවද දැන්වූ ගරු උපසභාපතිතුමන් විසින් සේවා අත්හිටවූ ඒ.ඒ.යූ.එන්. සෝමරත්න මහතා සේවා ගිවිසුමක් මත තානායමේ කළමනාකරු ලෙස බඳවා ගෙන ඇති බවත් නිසි පරිදි රාජකාරී ඉටු නොකිරීම නිසා සේවය අත්හිටුවීමට කටයුතු කර ඇති බවත් සේවා ගිවිසුමේ ප්‍රකාරව කටයුතු කර නොමැති බවත් ලක්ෂ 09 ක පාඩුවක් සිදුව ඇති අතර අධිභාරයේදී මෙය නගරසභා ආදායමෙන් ගෙවිය යුතු බවත් පෙන්වා දෙන ලදි. ගරු සභාපතිතුමාගේ බෑණා කළමනාකරු ලෙස පත් කල බවත් එතුමන් විසින්ම ඔහු සේවයෙන් අතහිටවූ අතර තම පුතා වන ළහිරු වීරසිංහ මහතා නැවත තනතුරට පත් කළ බවත් මෙම කරුණු නිසා තානායම පිළිබඳ විනිවිද භාවයකින් කතා කළ නොහැකි බවත් පෙන්වා දුන් ගරු උපසභාපතිතුමා 2014-10-28 දින තානායම් කමිටු වාර්තාවේදී 03 වන කරුණ ලෙස තානායම ටෙන්ඩර් කිරීමට තීරණය කර ගත් අතර 04 වෙනි කරුණ ලෙස තානායමේ දැනට සිටින කාර්ය මණ්ඩලයට මෙය පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ලබාගැනීමටත් මාසිකව නිශ්චිත මුදලක් නගර සභාවට ගෙවීම පදනම යටතේ ලබාදීමේ හැකියාව සොයාබලන ලෙසට ගරු සභාවට ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදි. සභාතීරණය සමග පළාත් පාලන කොමසාරිස් වෙත යොමුකිරීමට සාකච්ඡාකරන ලදි.

එහෙත් තානායම් කාර්ය මණ්ඩලයේ අභියාචනය සභාතීරණයක් නොමැතිව පළාත් පාලන කොමසාරිස් වෙත යොමුකිරීම නීත්‍යානුකූල නොවන බවද, 2015-01-29 වන දින සභාවේදීද තානායම ටෙන්ඩර් කිරීමට තීන්දු කළ බවට සඳහන් වුවත් 2014-10-28 වන දින එම තීන්දුව ගත් බවත්, වසර ගණනකට පෙර මෙම තීරණය ගැනීමට යෝජනා කළ බවත් කිනම් තරාතිරමක වුවද පුද්ගලයන් සමග මේ පිළිබඳ සාකච්ඡා කිරීමට සූදානම් බවත් සාධාරණ තීන්දුවක් ගත යුතු අතර ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගේ සහ නිලධාරීන්ගේ ආරක්ෂණය සැලසීම සඳහා රු. 10000 ට වැඩි ගෙවීම් අනුමත නොකළ නමුත් සාකච්ඡා කර ගැටළු විසඳාගැනීමට ක්‍රියාකරන ලෙස ඉල්ලා සිටින ලදි. එසේම තානායම ටෙන්ඩර් කලහොත් ලක්ෂ 05කට වැඩි මිලකට එය අලෙවි වන බවත් එතුමා ප්‍රකාශ කළේය.

**ගරු සභාපතිතුමා**
යම් ගැටළු පැවති නමුත් තානායමේ වත්මන් තත්ත්වය අනුව තිබූ පාඩු මගහරවා ගෙන ඉදිරියට පවත්වාගෙන එන බවත්, නිවැරදි ගෙවීම් බැවින් ජනවාරි 31 දක්වා ගෙවීම් අනුමත කිරීම කළ යුතු බවත්, ටෙන්ඩර් කරන්නේ නම් වැඩිම මිලට එය ලබාදිය යුතු බවත් සඳහන් කරන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**
තානායම ටෙන්ඩර් කිරීම තම පැහැදිලි මතය වන බව නැවතත් ප්‍රකාශ කරන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී චමික ජයම්ණ වැවේගෙදර මැතිතුමා**
ගරු සභාව විසින් ගත් තීරණය අනුව තානායම ටෙන්ඩර් විය යුතු බවද එම දිනය තිරණය කරගත යුතු අතර එම කටයුතු සිදුවූ පසු ගෙවීම් අනුමත කරන බවද එක් පිරිසක් කළ අකටයුතු සඳහා ගෙවීම් කිරීමේ සූදානමක් නොමැති බවද ප්‍රකාශ කරන ලදි.

**ගරු උපසභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**
ප්‍රායෝගික දැනුම අනුව ලාභපාඩු තේරුම් ගැනීමේ ශක්තිය පවතින බවද ගරු සභාපතිතුමා තමාගේ වාසියට කටයුතු කරන බවද 2014-10-28 ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගත් තීරණය පළාත් පාලන කොමසාරිස් වෙත නොයැවූ හේතුව විමසන ලදි. එසේම තානායමට සේවකයන් බඳවා ගැනීමේදී සේවා ගිවිසුමක් සේම ඇප මුදලක් (keymoney) අදාළ අයගෙන් අයකර ගත යුතු බවද විවිධ හේතු නිසා නිලධාරීන් අමාරුවේ වැටෙන බව ගරු උපසභාපතිතුමා විසින් පැහැදිලිව පෙන්වා දෙන ලදි.

**ගරු සභාපතිතුමා**
ඉදිරි මාස 03 ක් තානායම කරගෙන යාමට සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටි අතර එය මාසයක් විය හැකි බවද නිලධාරීන් යොදවා හෝ මන්ත්‍රීවරුන්ගේ අධීක්ෂණය යටතේ එය කරගෙන යන බව ප්‍රකාශ කරන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා**
පසුගිය සභාවාරයේ දී තානායමේ වත්මන් තත්ත්වය පිළිබඳ සාකච්ඡා කළ අතර ටෙන්ඩර් කිරීමට තීරණය කර ගත් බවත්, සභාවේ ගත් තීන්දුව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇති බවත් කොමසාරිස් විසින් ඉදිරි මාස 03 ක් තව දුරටත් තානායම පවත්වාගෙන යාමට උපදෙස් දී ඇති බවත්, එසේම පෙර තීරණයේම අදත් සිටින බවද තානායම නගර සභාවට ආඩම්බර ආයතනයක් බවද, යම් අයෙක් මෙම ස්ථානය දේශපානය කරන ස්ථානයක් ලෙස තීරණය කළ හැකි නමුත් එතැන දේශපානය කිරීම ගැටලුවක් කර නොගත යුතු බවද, තානායමේ සේවා සඳහා වියදම් මුදල් ගෙවිය යුතු බවද, තානායම යනු විශාල ලෙස අලාභ සිදු නොවන තැනක් බවද ඒ නිසා ඉදිරි මාස 03 සඳහා පළාත් පාලන කොමසාරිස්තුමියගේ උපදෙස් පරිදි තානායම නගරසභවෙන් පැවැත්විය යුතු බවද, පළාත් සභා නිලධාරීන් හා මහඇමතිතුමා හමුවී සාකච්ඡා කරගැනීමට ගරු සභාපතිතුමා කටයුතු සම්පාදනය කර දෙනු ඇති බවද නගර සභාවට ආදායමක් ලැබෙන තැනක් බැවින් හා දිගින් දිගටම පාඩු ලබන ආයතනයක් නොවන බැවින් යුතුකමක් ලෙස මාස 03 ක් මේ ආකාරයටම වැඩකටයුතු කිරීම සුදුසු බවට දන්වන ලදි.

එසේම නීත්‍යානුකූව 20% ක ලාභයක් ලැබිය යුතු නමුත් පසුගිය කාලයේ බඩුමිල වැඩිවීමද, බළන්ගොඩ ප්‍රදේශයේ හෝටල් වැඩිවීමද, වැට්බදු ද ආදී හේතු නිසා ලාභ ප්‍රතිශතය අඩුවී ඇති බවද, මාර්තු මාසයේ සේවා කාලය අවසන් වී ඇති බැවින් සමහර විට නගර සභාව කොමසාරිස් පාලනයට නතු වීම හෝ කාලය දීර්ඝ කිරීමක් සිදුවියහැකි බවත්, ගනුලැබූ තීරණ මාර්තු 08 න් පසු වෙනස්විය හැකි බවත් මෛත්‍රීපාල සිරිසේන මහතා නොසිතු ලෙෂ ජනපති වූ බවත්, එලෙස නගර සභාව තුළද වෙනස්වීම් සිදුවිය හැකි බවත්, විපක්ෂයේ තීරණය සැමවිටම සියලුම දේට සැම දෙයකටම විරුද්ධවීම වන නමුත් කණ්ඩායමක් ලෙස එක්වී තානායම ලාභ ලැබියහැකි ස්ථානයක් ලෙස ගොඩනැගීමට කටයුතු කරන ලෙසත්, රු. 10000 ට වැඩි ගෙවීම් අනුමත කිරීමට යෝජනා කරන බවද ප්‍රකාශ කර සිටින ලදි.

**ගරු උපසභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

ගරු මන්ත්‍රී රූමි මැතිතුමා පවසන ආකාරයට විපක්ෂයේ ස්වභාවය සෑම යෝජනාවකට විරුද්ධ වීම වන නමුත් මෙවර අයවැයට පක්ෂව ඡන්දය ලබාදුන් බවද එතුමාගේ කතා නිසා ගැටලු මතුව ඇති බවද අයවැයට පක්ෂව ඡන්දය දීමේදී විපක්ෂය හොඳ වීමත් අනෙක් ගැටලු සම්බන්ධයෙන් විපක්ෂය විරුද්ධ වීමත් යන මෙතුමාගේ මතය විහිලුසහගත බවද ගරු උපසභාපතිතුමන් විසින් පෙන්වා දෙන ලදි. එසේම ඉදිරියේදී අනිවාර්යයෙන් පළාත් පාලන කොමසාරිස්තුමිය හමුවී එතුමිය සමග සාකච්ඡා කරන බවද නොමග ගිය කොමසාරිස්තුමියට සත්‍ය කරුණු සාක්ෂි සමග ඉදිරිපත් කරන බවද බලන්ගොඩ ප්‍රදේශයේ 1/4 ක් වූ මුස්ලිම් ජනතාවක් සිටින නමුත් ප්‍රදේශයේ ජන මතය වෙනස් වන සුලුබවද සත්‍ය කතා කිරීමේ දී පක්ෂ භේදයක් නොසලකන බවද වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා**

තමන්ගේ මැදිහත්වීම නිසා ගරු උපසභාපතිතුමාට එම තනතුර ලැබුණ බවත් හිටපු ජනපතිට ලක්ෂ 20ක ඡන්ද අහිමුවූ ආකාරයට ගරු උපසභාපතිතුමාට ඉදිරි මැතිවරණයේදී ඡන්දෙන් තේරීපත්වීම අභියෝගයට ලක් කරන බවත් ප්‍රකාශ කරන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

දිගින් දිගටම මෙම ගැටලුව පිළිබඳ සාකච්ඡා කිරීම අනවශ්‍ය බවද පසුගිය සභාවාරයේදී තානායම ටෙන්ඩර් කිරීමට එකඟ වූ බවද නමුත් අභියාචනය පළාත් පාලන කොමසාරිස්තුමියට යොමු කර අතර ඇය ලබාදී ඇති උපදෙස් සාවද්‍ය හෙයින් උපසභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරු එතුමිය සමග සාකච්ඡා කිරීමට අවශ්‍ය බව පවසන හෙයින් එම සාකච්ඡාවෙන් පසු ඒ පිළිබඳ අවසාන තීරණයක් ගැනීම සුදුසු බවත් ඉදිරි මහ සභාවේදී එම තීරණය ගත හැකිබවත් පෙන්වා දෙන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා**

සභාවේ අවසාන කාලයේ ගැටලු ඇතිකර නොගෙන කටයුතු කල යුතු බවත් යහපත් සියලුම දේ සඳහා සහයෝගය ලබාදෙන බවත්, ඒ අනුව අයවැය සඳහා සහයෝගය ලබාදුන් බවත්, තානායම ටෙන්ඩර් කිරීම ගිය සභාවාරයේ ගත් තීරණයක් නොවන බවත්, කාලයක සිට මේ පිළිබඳ සාකච්ඡා කළ බවත්, එසේම මේ ආකාරයට තානායම විවේචනය වීම නුසුදුසු බවත් එය නගර සභාවේ නාමයට කැළලක් බවත්, ගරු සභාපතිතුමාගේ ඉල්ලීම පරිදි තානායම ටෙන්ඩර් විය යුතු බවද අද දින අවසාන තීරණයට පැමිණීම අපහසු බැවින් ඉදිරි මහ සභාව සඳහා යොමුකිරීම සුදුසු බවත්, ගරු උපසභාපතිතුමා, පළාත් පාලන කොමසාරිස්තුමිය සමග සාකච්ඡා කරන්නේ නම් එම කටයුත්ත අවසන් කර තීන්දුවකට පැමිණීමට කටයුතු කරන ලෙසද ඉල්ලා සිටින ලදි.

**ගරු උපසභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

පළාත් පාලන කොමසාරිස් හමුවීමට බලාපොරොත්තුවක් නොතිබූ නමුත් අභියාචනා ආදිය මෙන්ම ගරු සභාවෙන් ගත් තීරණ නියමාකාරයෙන් ක්‍රියාත්මක නොවීම හා ඒවා වෙත සැලකීමක් නොදැක්වීම ද වෙනත් නොයෙක් හේතු නිසා එතුමිය හමුවීමට කටයුතු කරන බවද සියලුම මන්ත්‍රීවරු මෙන්ම නිලධාරීන් ඉදිරිපිට මෙම තොරතුරු සාකච්ඡා කළ හැකි බවද ප්‍රකාශ කළ ගරුඋපසභාපතිතුමා තානායමේ බීම අලෙවිහලේ බීම කල්ඉකුත්වීම ඉක්මනින් සිදුනොවන හෙයින් එයින් අනිවාර්ය ලාභ ලැබිය යුතු බවද නමුත් එයින්ද අලාභ සිදුවන බවද දන්වා සිටින ලදි.

**ගරු සභාපතිතුමා**

ඉදිරි මාස 03 තානායම මේ ලෙසම පවත්වාගෙන යන බවත් නමුත් දැඩි ලෙස අධීක්ෂණය කරන බවත් පළාත් පාලන කොමසාරිස්තුමියගේ උපදෙස් මත ප්‍රගතිය වාර්තා කර මාස 03 අවසානයේ තීන්දුවක් ගන්නා බවත් පවසන ලදි. එසේම තානායමේ මුල් ස්වරූපය අමතක වී ඇති බවත් කිරි කලයට ගොම මුසුකිරීම වැනි සිදුවීමක් සිදුව ඇති බවත් තානායම විනාශවීම බලාසිටීමට නොහැකි කරුණක් බවත් මෙම මාස 03 ඉදිරියටත් මේ ආකාරයට

තානායම පවත්වාගෙන යාමට උපදෙස් ලබා දෙන බවත් පාඩු වුවහොත් ගෙවීම් සිදු නොකරන ලෙසත් දනට ගෙවීම් සිදුකරන ලෙසත් උපදෙස් ලබාදෙන ලදි. එසේම පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ නියෝජනයක් මහා සභාව සඳහා අවශ්‍ය බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.

**06:02 මහජන පොළ පිළිබඳ සාකච්ඡා කිරීම**

**නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

මහජන පොළ පිළිබඳ සාකච්ඡාවට කැඳවන ලද්දේ අතුරු ව්‍යවස්ථාව සාදා ගැනීමට වන නමුත් එය ඉවතට විසිකළ බවද, ගරු සභාපතිතුමා විසින් කඩ සඳහා අයිතියක් ලබාදීමට යෝජනා කළ බවද, එය එසේ කළ නොහැකි කාර්යයක් බවද සාකච්ඡා නොකර කඩ වල අයිතිය ලබාදීමට යෝජනා කිරීම වැරදි සහගත බවද මෙම කරුණු සාකච්ඡා කර ගැනීමට මෙම කරුණ න්‍යාය පත්‍රයට ඇතුළත් කළ බව පෙන්වා දෙන ලදි. කඩකාමර එකවර ලබාදිය නොහැකි බවද මේවන විට නගර සභාව ණයක පැටලී ඇති බවද වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා**

මහජන පොළ කඩකාමර එම බදුහිමියන්ට ලබාදෙන බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශකර ඇති බවත්, මේ නිසා 26 වන දින ඔප්පු ලබාගැනීමට එම පිරිස් සූදානම් වී ඇති බවත්, නමුත් මෙසේ කඩකාමර ලබාදීමේ නීත්‍යානුකූල අයිතියක් නොමැති බවත් ඔප්පු ලබාදෙන බවට කළ ප්‍රකාශය සම්බන්ධයෙන් විරෝධය පළ කරන බවද දේශපාලනයේ පොත ගරු සභාපතිතුමා වන අතර එම පොත පරිශීලනයෙන් දේශපාලනය ඉගෙන ගන්නා බවද ප්‍රකාශ කර සිටින ලදි.

**ගරු උපසභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

2014-11-27 දින මහා සභා වාර්තාවට අනුව අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කරන ලෙස යෝජනා කරන ලද්දේ ගරු සභාපතිතුමා විසින් බවත් ගිවිසුම් ලබාදෙන්නේ නම් ලියාපදිංචි කර නීත්‍යානුකූල ලෙස එම කටයුතු සිදුවිය යුතු බවත් දන්වා සිටින ලදි. එසේම රන් මහත්මයා මහත්මයාට හිමි රු. 100000 වියදම් වූ කඩ කාමරයක් කඩාදැමීමට සිදුවීම නිසා ගරු සභාපතිතුමා තීරණය කර ඔහුට කඩකාමරය ලබාදීම පිළිබඳ සලකා බලන ලෙස ඉල්ලා සිටින ලදි.

**ගරු සභාපතිතුමා**

අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කර ඉදිරිපත් කිරීමට එකගතාවය පළ කල අතර බදු ගිවිසුම් ලියාපදිංචි කිරීමට කටයුතු කරන බවද දන්වන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

වාර්ෂික ගිවිසුම් මත ඉහත තීරණය කල කඩකාමරවලට අමතරව අනෙක් කඩ කාමරද ලබාදෙන ලෙස යෝජනා කරන ලදි.

**නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා**

අතුරු ව්‍යවස්ථාව මහා සභා වාර්තාව සමග ඉදිරිපත් කරන ලෙස දන්වන ලදි.

**06:03 වැසිකිළි ආධාර ලබාදීම සඳහා සැලසුමක් සකස් කිරීම**

මන්ත්‍රී ප්‍රතිපාදන වලට අමතරව නිවාස හා වැසිකිළි ආධාර ලෙස රු. 100,000 ක බැගින් මුදලක් එක් මන්ත්‍රීවරයෙකුට ලබාදෙන බවද එය මුද්දර ගාස්තු යටතේ ලැබී ඇති බවද එක් පුද්ගලයෙකුට රු. 10000 බැගින් පුද්ගලයන් 10 දෙනෙකුගේ එම ආධාර ලබාදිය යුතු නාම ලේඛන පෙබරවාරි 26 දිනට පෙර ලබාදෙන ලෙස ද ගරු මන්ත්‍රීවරුන් දනුවත් කරන ලදි. එක් පුද්ගලයෙකුට ලබාදෙන මුදල අඩුකළ හැකි බවද ගරු සභාපතිතුමන් විසින් දන්වන

ලදි. මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත පරිදි මෙම බෙදීම් රු. 5000-10000 අතර මුදලකින් චෙක්පතක් මගින් ලබාදීමට කටයුතු කල හැකි බවද ප්‍රකාශ කළේය.

**06:04 ඩෙංගු රෝගය නැවත පැතිරීම අවම කිරීම සඳහා දැනුවත් කිරීම් වැඩසටහන් වලට වියදම සඳහා අනුමැතිය ඉල්ලීම**

මේ වන විට ප්‍රදේශයේ ඩෙංගු රෝගීන් ගේ සංඛ්‍යාව 06 දක්වා ඉහළ ගොස් ඇති බැවින් හදිසි තත්ත්වයක් ලෙස සකසා මිල ගණන් විමසා පහත සඳහන් ද්‍රව්‍ය ලබාගැනීමට අනුමැතිය ලබාදෙන ලදි.

1. සොල්ෆැක්ස් ලීටර් 12
2. Spar 1% කිලෝග්‍රෑම් 10

නාගරික බල ප්‍රදේශයේ සියලුම කොට්ඨාශ ආවරණය වන පරිදි අදාල වැඩසටහන සඳාහා වැයවන සියලුම මුදල් අදාළ වැය ශීර්ෂ යටතේ අනුමත කරන ලෙස ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 15. අවසානය

ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ කටයුතු ප. ව. 1.00 ට අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.